# ව්‍යාපාර අධ්‍යනය

# 03 වන පාඩම

## රජය හා ව්‍යාපාර **Video 01**

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# රජය හා ව්‍යාපාර

ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කෙරෙහි රාජ්‍ය බලපෑම පහත ආකාරවලින් සිදු වේ.

- මධ්‍යම රජය
- පළාත් සභා
- පළාත් පාලන ආයතන (මහ නගර සභා/නගර සභා/ප්‍රාදේශීය සභා)

# රජය ව්‍යාපාරවලට මැදිහත් වන ආකාර සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- **යටිතල පහසුකම් සැපයීම නිදසුන්**

  - මධ්‍යම රජය - විදුලි බලය සැපයීම

  - පළාත් සභා - මාර්ග නඩත්තුව

  - පළාත් පාලන ආයතන - අපද්‍රව්‍ය ඉවත් කිරීම

  - පළාත් පාලන ආයතන - පෞද්ගලික අංශය හා සමාන ව වෙළෙඳසැල් ඉදිකර කුලියට දීම

- **තරගකරුවෙකු වීම නිදසුන් :**

  - **මධ්‍යම රජය - පෞද්ගලික අංශයේ රූපවාහිනී නාලිකා සමග තරගකාරී ව රාජ්‍ය අංශයේ රූපවාහිනි නාලිකා ක්‍රියාත්මක කිරීම**

  - **පළාත් සභා - ඒ ඒ පළාත් සභා යටතේ පෞද්ගලික අංශය හා තරගකාරී ව ව්‍යාපාර පවත්වා ගෙන යාම**

- **ගනුදෙනුකරුවෙකු වීම නිදසුන් :**

- ○ මධ්‍යම රජය - වී මිල දී ගැනීම, විවිධ කාර්යාලීය උපකරණ මිල දී ගැනීම, ලක් සතොස හරහා භාණ්ඩ විකිණීම

- ○ පළාත් සභා - ආරක්ෂක සේවා ලබා ගැනීම හා ලබා දීම

- ○ පළාත් පාලන ආයතන - ආදාහනාගාර පවත්වා ගෙන යාම

- **ප්‍රතිපත්ති සම්පාදනය කිරීම නිදසුන් :**

  - මධ්‍යම රජය - මූල්‍ය ප්‍රතිපත්ති හා පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
  - පළාත් සභා - ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම
  - පළාත් පාලන ආයතන - පරිසර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

- **නීති රීති පැනවීම නිදසුන් :**

○ මධ්‍යම රජය - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, ප්‍රමිති පනත

○ පළාත් සභා - පෞද්ගලික බස් රථ සඳහා නිතීරීති පැනවීම

○ පළාත් පාලන ආයතන - ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා නීති රීති පැනවීම

- **බදු අයකරන්නෙකු වීම නිදසුන් :**

  - මධ්‍යම රජය - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා බදු අය කිරීම

  - පළාත් සභා - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් බදු අය කිරීම

  - පළාත් පාලන ආයතන - වරිපනම් බදු අය කිරීම

# රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහාය හා මගපෙන්වීම වැදගත් වන ආකාරය

- ව්‍යාපාර ලියාපදිංචියට යොමු වීම
- කීර්තිනාමය වර්ධනය වීම
- රටේ සංවර්ධනයට දායක වීම
- රජයේ හා මහජනයාගේ පිළිගැනීම ලැබීම

## රජයක් පහත දැක්වෙන ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කරයි.

- **ආර්ථික වර්ධනය හා සංවර්ධනය**

නිෂ්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩ වර්ධනය තුළින් ආර්ථික වර්ධනයක් සිදු වන අතර ඊට අමතර ව මානව හා සමාජ දර්ශකවල දිගුකාලීන වර්ධනය සංවර්ධනය ලෙස හඳුන්වයි

- **පූර්ණ සේවා නියුක්තිය**

ශ්‍රමය සැපයීමට බලාපොරොත්තුවෙන් සිටින සියලු දෙනා යම් සේවාවක නියුක්ත වී සිටීම මෙන්ම ආර්ථිකය සතු සියලුම නිෂ්පාදන සම්පත් ඵලදායී නිෂ්පාදන කටයුත්තක යොදවා තිබීම

- **සාධාරණ ආදායම් ව්‍යාප්තිය**

රටක සමස්ත නිෂ්පාදිතය ඒ රටෙහි වෙසෙන සමස්ත ජනතාව අතර සමාන ව බෙදා හැරීම

## ආර්ථික ස්ථායිතාව

ආර්ථිකයේ දේශීය හා විදේශීය වශයෙන් අර්බුදයක් ඇති නොවීමට ඔරොත්තු දීමේ හැකියාව ආර්ථික ස්ථායිතාවයි

ආර්ථික ස්ථායිතාව කොටස් දෙකකින් යුක්ත වේ.

### 1. අභ්‍යන්තර මිල ස්ථායිතාව

අභ්‍යන්තර මිල ස්ථායිතාව තුළින් උද්ධමනය පාලනය, මිල මට්ටම ස්ථාවරව පවත්වා ගැනීම, පොලී අනුපාතය පාලනය කිරීම සිදු කෙරේ

### 2. බාහිර මිල ස්ථායිතාව

බාහිර මිල ස්ථායිතාව තුළින් විදේශ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සිදු කෙරේ.
යහපත් අන්තර් ජාතික වෙළෙඳාම විදේශ වෙළෙඳ කටයුතු සතුටුදායක අන්දමින් පවත්වා ගෙන යාම තුළින් ගෙවුම් ශේෂ තත්ත්වය ආරක්ෂා කර ගැනීම මින් අපේක්ෂා කෙරේ.

## රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර විවිධාකාරයෙන් දායක වේ.

- **බදු ගෙවීම**

රජයට ගෙවිය යුතු බදු පැහැර හැරීමකින් තොර ව තමා උපයාගත් ලාභය හා ආදායම් මත නියමිත පරිදි  බදු ගෙවීම

- **දේශීය සම්පත් භාවිතය**

හැකිතාක් උපරිමයෙන් තමනිෂ්පාදන සඳහා දේශීය සම්පත් යොදා ගැනීම

- **රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම**

රජය ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා පිළිපැදීම

- **නීති රීති පිළිපැදීම**

ව්‍යාපාර සඳහා පනවා ඇති නීති රීති ඒ ආකාරයෙන් ඉටු කරමින් යහපත් ව්‍යාපාරික පරිසරයක් ගොඩනැගීමට දායක වීම

- **සේවා නියුක්තියට දායක වීම**

ඵලදායී ලෙස නිෂ්පාදන කටයුතු කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ඇතුළු සියලු සම්පත් කාර්යක්ෂම ව භාවිතයට ගැනීම

- **පරිසරයට වන හානිය අවම කිරීම**

සියලු ව්‍යාපාර පරිසර හිතකාමී ලෙස ඒවායේ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම

## රජය හා ව්‍යාපාර අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවක් පවත්වා ගැනීම වැදගත්කම.

- රජය ව්‍යාපාරවලට අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ව්‍යාපාර දිරිමත් වේ.

- ව්‍යාපාර වර්ධනය තුළින් රජයේ අරමුණු ඉටු වේ.

- ව්‍යාපාර වර්ධනය නිසා රජයට බදු ආදායමක් ලබා ගත හැකියි

- එම ආදායම් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා හා අනෙකුත් කාර්යයන් සඳහා යොදාගත හැකි ය.

මේ නිසා රජයත් ව්‍යාපාරත් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම අවශ්‍ය වේ.

# පිස්කල් ප්‍රතිපත්තිය

**රජයේ ආදායම් හා වියදම් සම්බන්ධව රජය සිදු කරන කටයුතු පිස්කල් ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ.**

**රජයේ පිස්කල් ප්‍රතිපත්තියේ අරමුණ, සාර්ව ආර්ථික ස්ථායීතාව ආරක්ෂා කර ගැනීම වේ.**

## රාජ්‍ය ආදායම

යම් ආර්ථිකයක මුදල් වර්ෂයක් තුළ බදු හා බදු නො වන මාර්ගවලින් ලැබෙන ආදායම රාජ්‍ය ආදායම වේ

## රාජ්‍ය වියදම

රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වර්ෂයක් තුළ දී කරනු ලබන මුළු වියදම රාජ්‍ය වියදම වේ.

රාජ්‍ය අයවැය ලේඛනය මගින් රජයේ පිස්කල් ප්‍රතිපත්තිය පිළිබිඹු වේ.

# රාජ්‍ය ආදායම පහත පරිදි වර්ග කෙරේ

## රාජ්‍ය ආදායම

- බදු ආදායම
- බදු නො වන ආදායම

## බදු ආදායම

- ආදායම් බදු
- එකතුකල අගය බදු
- නිෂ්පාදන බදු
- ආනයන මත බදු
- අනෙකුත් බදු

# බද්දක්

බද්දක් යනු යම් පුද්ගලයකු හෝ ආයතනයක් විසින් අනිවාර්යයෙන් ම ගෙවිය යුතු යැයි රජය හෝ රජයේ බලාධිකාරී ආයතනයක් විසින් නියම කරනු ලබන ගෙවීමකි.

ආදායම් බදු : පුද්ගලයින්ගේ හා ආයතනවල ආදායම මත අය කරනු ලබන බද්දකි

නිදසුන් : සමාගම් බදු, උපයන විට ගෙවීම් බදු

එකතු කළ අගය මත බදු : භාණ්ඩ හා සේවා මත එකතු කළ වටිනාකමට අය කරන බදු එකතු කළ මත බදු අගය මත බදු වේ

නිදසුන් : තොග හා සිල්ලර වෙළෙඳාම මත එකතු කළ අගය මත බදු ආනයන මත එකතු කළ අගය මත බදු

**නිෂ්පාදන බදු/ දේශීය භාණ්ඩ බදු** : දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ඇතැම් භාණ්ඩ මත අය කරන බදු

නිදසුන් : සිගරට් හා දුම්කොළ නිෂ්පාදන මත බදු, සුරා බදු

**ආනයන මත බදු** : විදේශයී රටවල්වලින් ආනයනය කරන භාණ්ඩ සඳහා රේගුවේ දී අය කරන බදු වේ

නිදසුන් : මෝටර් රථ ආනයන මත බදු

**අනෙකුත් බදු** : ඉහත බදු වර්ගවලට අයත් නො වන එහෙත් අනෙකුත් පාර්ශ්වවලින් අයකරන බදු වර්ගයි

නිදසුන් : වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සෙස් බද්ද, විදුලි සංදේශ බදු

## බදු ආදායම සෘජු බදු හා වක්‍ර බදු ලෙස ද වර්ග කළ හැකිය

### සෘජු බදු

**පුද්ගලයන්ගේ හෝ ව්‍යාපාරවල ආදායම මත හෝ වත්කම් මත අය කරනු ලබන, ගෙවන පුද්ගලයා විසින්ම දැරිය යුතු බදු සෘජු බදු වේ.**

- පුද්ගල ආදායම් මත බදු
- සමාගම් බදු
- රඳවා ගැනීමේ බදු
- ප්‍රාග්ධන ලාභ මත බදු

# වක්‍ර බදු

භාණ්ඩ හා සේවා මත අය කරනු ලබන, ගෙවන ලද බද්ද වෙනත් පාර්ශ්වයකට විතැන් කළ හැකි බදු වක්‍ර බදු වේ.

- එකතුකල අගය බදු
- නිෂ්පාදන බදු
- රේගු බදු

# රජයේ බදු නො වන ආදායම් පහත පරිදි දැක්විය හැකිය.

## බදු  නොවන ආදායම

### ලාභ හා ලාභාංශ

නිදසුන් : රජයේ ආයතනවලින් ලද ලාභ හා ලාභාංශ

### ගාස්තු හා අයකිරීම්

නිදසුන් :මෝටර් රථ ආදායම් බලපත්‍ර ගාස්තු හා අයකිරීම්

### පොලී වෙනත් ආදායම්

නිදසුන් :සඳහා ලොතරැයි ආදායම

# රාජ්‍ය වියදම් පහත පරිදි වර්ග කෙරේ

## රාජ්‍ය වියදම

- වර්තන වියදම්
- ප්‍රාග්ධන වියදම්

## වර්තන වියදම්


රාජ්‍ය සේවා අඛණ්ඩ ව පවත්වා ගැනීම සඳහා වසරක් තුළ නැවත නැවත සිදු කළ යුතු වියදම්ය. මේවා පුනරාවර්තන වියදම් ලෙස ද හඳුන්වයි

නිදසුන් : වැටුප් හා වේතන, පොලී ගෙවීම්

# ප්‍රාග්ධන වියදම්

රජයක් විසින් දිගුකාලීන ආයෝජන සඳහා දරන වියදම් ප්‍රාග්ධන වියදම් වේ.

නිදසුන් : මහාමාර්ග ඉදිකිරීම පාලම් ඉදිකිරීම
(රජයේ ආදායම් හා වියදම් සංයුතිය අයවැය යෝජනා ඉදිරිපත් කිරීමත් සමග වෙනස් විය හැකි ය).



රජය විවිධ අවස්ථාවල දී විවිධ බදු වර්ග පනවන අතර විවිධ බදු වර්ග අහෝසි කිරීම ද කරනු ලැබේ.

බදුවලින් ලබන ආදායම රජයේ විවිධ ව්‍යාපෘති සඳහා වැය කරය.

නිදසුන් : මාර්ග ඉදිකිරීම, ගුවන් තොටුපොල ඉදිකිරීම හා සංවර්ධනය, වරාය සංවර්ධනය

## රජයේ පිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

- ආනයනකි  භාණ්ඩ  සඳහා රේගු බදු අය කිරීමෙන් ආනයන සීමා වන අතර ම දේශීය නිෂ්පාදනය වර්ධනය කර ගත හැකි ය. /දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගත හැකි වේ

- දේශීය නිෂ්පාදිත මත බදු අය කිරීමෙන් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම සිදු විය හැකි ය.

- රජය, යටිතල පහසුකම් මත වියදම් දැරීම නිසා ව්‍යාපාරික කටයුතු  පහසු කෙරේ.

# ව්‍යාපාර අධ්‍යනය

# 03 වන පාඩම

## රජය හා ව්‍යාපාර **Video 02**

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# මූල්‍ය ප්‍රතිපත්ත

රටක මුදල් සැපයුම  පාලනය කිරීම සඳහා රජය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තයයි.

රජය වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවයි.

රජයේ මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ දේශීය ආර්ථිකය තුළ මිල ස්ථායිතාව පවත්වා ගැනීමයි.  නැතහොත් උද්ධමනය පාලනය කිරීමයි.

එහි දී දිගු කාලයක් පුරා මිල මට්ටම් ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාම අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත උපකරණ භාවිත කෙරේ

# පොලී අනුපාතිකය

රජයේ මුදල් පාලනය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන උපකරණය පොලී අනුපාතිකය වේ. මෙය නිත්‍ය පහසුකම් අනුපාතකිය ලෙස ද මහ බැංකුව හඳුන්වයි.

නිත්‍ය පහසුකම් අනුපාතකි යේ **(Standing Facility Rate )** ප්‍රධාන කොටස් තුනකි.

- නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතයි **tanding Deposit Facility Rate (SDFR)**
- නිත්‍ය ණය පහසුකම් අනුපාතය **(tanding Lending Facility Rate (SLFR)**
- බැංකු පොලී අනුපාතිකය

- **නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය**

වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් මහ බැංකුවේ ඇති රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ දී ගෙවනු ලබන පොලී අනුපාතිකයයි.

- **නිත්‍ය ණය පහසුකම් අනුපාතය**

වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් රජයේ සුරැකුම් පත් ඇපයට තබා මහ බැංකුවෙන් අරමුදල් ලබා ගැනීමේ දී අය කරනු ලබන පොලී අනුපාතයයි.

- **බැංකු පොලී අනුපාතිකය**

ද්‍රවශීලතා දුෂ්කරතා වලට මුහුණ දෙන වාණිජ බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව අවසාන ණය දෙන්නා ලෙස සපයනු ලබන ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතයයි.

## සංචිත අවශ්‍යතා වෙනස් කිරීම

වාණිජ බැංකුවල පවතින තැන්පතුවලට අදාළ ව මහ බැංකුවේ පවත්වා ගත යුතු තැන්පතු ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිතය වේ. මෙය වෙනස් කිරීම නිසා මුදල් සැපයුමේ අඩු වැඩි වීම් සිදු වේ. සංචිත අවශ්‍යතා අඩු කිරීම මුදල් සැපයුම වැඩි වීමට හේතු වේ. සංචිත අවශ්‍යතා වැඩි කිරීම මුදල් සැපයුම් අඩු වීමට හේතු වේ.

## විවෘත වෙළෙඳපොළ කටයුතු (විවට වෙළෙඳපොළ කටයුතු )

මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් මිලට ගැනීම හා විකිණීම විවෘත වෙළෙඳපොළ කටයුතු වේ. මහ බැංකුව සැරැකුම්පත් මිලට ගැනීමේ දී මුදල් සැපයුම ප්‍රසාරණය වන අතර විකිණීමේ දී මුදල් සැපයුම සංකෝචනය වේ.

# වට්ටම් අනුපාත වෙනස් කිරීම

මහ බැංකුව විසින් නිකුත් කරන සුරැකුම්පත් මිල දී ගත් පාර්ශ්ව ඒවා කල් පිරීමට පෙර වාණිජ බැංකුවලට ඉදිරිපත් කර වට්ටම් කරවා ගැනීමේ දී අය කරන වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම තුළින් ආර්ථිකයේ මුදල් සැපයුම පාලනය කළ හැකි වේ.

## ණය සීමා පැනවීම

ණය සීමා පැනවීම දෙයාකාරයකට සිදු වේ.

○ **ප්‍රමාණාත්මක ණය සීමා පැනවීම**

රටේ සමස්ථ මුදල් සැපයුමට බලපෑමක් ඇති කරන බැංකු ණය ප්‍රමාණය අඩු හා වැඩි කරමින් සමස්ථ ණය ප්‍රමාණය පාලනය කිරීම ප්‍රමාණාත්මක ණය පාලනය වේ

නිදසුන් :

වාණිජ බැංකුවල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාත නියම කිරීම ණයවර ලිපි නිකුත් කිරීමේ දී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණය නියම කිරීම

# ගුණාත්මක ණය සීමා පැනවීම

ආර්ථිකයක ණය ගලා යන දිශාව පාලනය කිරිම නැතහොත් ආර්ථිකයේ දිරි ගැන්විය යුතු යයි තෝරා ගත් අංශ සඳහා ණය ගලා යාම දිරිමත් කිරීමත්, අධෛර්යමත් විය යුතු අංශ කෙරෙහි ණය ගලා යාම සීමා කිරීමත් අරමුණු කොට ගෙන ක්‍රියාත්මක වන ක්‍රමය ගුණාත්මක ණය පාලනයයි

නිදසුන් :

ණය ලබා දෙන ක්ෂේත්‍ර නිර්දේශ කිරීම

කෘෂිකර්මාන්තය සඳහා ද? කර්මාන්ත සඳහා ද ?

ව්‍යාවසායකයන් සඳහා ද ? ආදී වශයෙන්.

අක්‍රීය ණය සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දැක්වීම

# ණය පාලනය කිරිම

මූල්‍ය ප්‍රතිපත්ති උපකරණයක් වශයෙන් ණය පාලනය කිරිම, ශ්‍රී ලංකා මහ බැංකුවේ සෘජු ක්‍රියා මාර්ගයකි.

මෙහි දී බැංකු ක්‍රමය මගින් සැපයෙන ණය ප්‍රමාණය, ණය ආපසු ගෙවීමේ කාලය  සහ ණය සඳහා ලබා ගන්නා සුරැකුම් යනාදී අංශ සම්බන්ධව ප්‍රමාණාත්මක හා ගුණාත්මක පාලනයන් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ලැබී ඇත.

ණය ප්‍රමාණය පාලනය කිරීමේ දී යම් බැංකුවක, යම් දිනක හෝ කාලයක ලබා දී ඇති උපරිම ණය ප්‍රමාණය පිළිබඳ සීමා පැනවීම හෝ ණය වර්ධන අනුපාත නියම කිරීම කළ හැකිය.

තව ද, ආර්ථිකයේ ප්‍රමුඛ අංශවලට සැපයෙන ණය ප්‍රමාණය ධෛර්යමත් කිරීමට විවිධ නිෂ්පාදන අංශවලට දිය යුතු අවම ණය ප්‍රමාණ නියම කිරීම හෝ උද්ධමනකාරී අවධියක දී පරිභෝජන ණය වර්ධනය සීමා කිරීමට පරිභෝජන ණය පිළිබඳ උපරිම සීමා නියම කිරීම කළ හැකි ය.

ණය අය කිරීමේ උපරිම කාලය සහ එම ණය සඳහා බැංකු ලබා ගත යුතු සැරැකුම්වල ස්වභාවය හා වටිනාකම පිළිබඳ නියෝග පැනවීම ද කළ හැකි ය. උද්ධමනකාරී අවස්ථාවක උද්ධමනය පාලනය කිරීම සඳහා පරිභෝජන ණය අධෛර්යමත් කිරීමට, පරිභෝජන ණය සඳහා ඉතා කෙටි ආපසු ගෙවීමේ කාල නියම කිරීම හා ඉහළ වටිනාකම් සහිත සුරැකුම් තබා ගැනීමට නියම කළ හැකි ය.

රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ඒවා ව්‍යාපාරවලට විවිධ ස්වරූපයෙන් බලපෑම් කරයි.

නිදසුන් :

- මහ බැංකු පොලී අනුපාතිකය අඩු කිරීමත් සමග වාණිජ බැංකු පොලී අනුපාතිකය ද අඩු වේ.
- එවිට ආයෝජකයින් වාණිජ බැංකු මගින් ලබාගන්නා ණය ප්‍රමාණය වැඩි වීමත් සමඟ ආයෝජන ද වැඩි වේ.
- ඒ තුළින් නිෂ්පාදනය වැඩි වී භාණ්ඩ මිල අඩු වේ.
- මිල අඩු වීම නිසා ව්‍යාපාරවල පිරිවැටුම වැඩි වී ලාභ වැඩි වේ.
- මහ බැංකු පොලී අනුපාතිකය වැඩි කිරීමත් සමග වාණිජ බැංකු පොලී අනුපාතිකය ද වැඩි වේ.

- එවිට ආයෝජකයින් වාණිජ බැංකු මගින් ලබා ගන්නා ණය ප්‍රමාණය අඩු වීමත් සමග ආයෝජනය ද අඩු වේ.
- එවිට නිෂ්පාදනය අඩු වී භාණ්ඩ මිල වැඩි වේ.
- මිල වැඩි වීම නිසා ව්‍යාපාරවල පිරිවැටුම අඩු වී ලාභ අඩු වේ

# පාරිභෝගික ආරක්ෂණය

පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබා දීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය පාරිභෝගික ආරක්ෂණය වේ.

# පාරිභෝගික ආරක්ෂණය මෑත කාලයේ අතීතයටත් වඩා අවශ්‍ය වීමට බලපා ඇති හේතු කිහිපයක් පහත දක්වේ.

- වෙළෙඳපොළ තුළ භාණ්ඩ හා සේවා බහුල වීම
- තරඟකාරිත්වය වැඩි වීම නිසා වෙළෙඳපොළ තුළ විෂමාචාර ඇති වීමට ඉඩ වැඩි වීම
- නිදහස් වෙළෙඳාම සමඟ වෙළෙඳපොළ සංකීර්ණ වීම
- ගෝලීයකරණය සමග ඇති විය හැකි සමාජ හා සංස්කෘතික පිරිහීම
- පරිසරය දූෂණය වීම වැළැක්වීම සඳහා පාරිභෝගිකයින් දැනුවත් කිරීම අවශ්‍ය විම

## පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට අත් වන වාසි කිහිපයක් පහත දැක්වේ.

### පාරිභෝගිකයාට

- ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලැබෙන භාණ්ඩ පාරිභෝජනයට අවස්ථාව ලැබීම
- වෙළෙඳ විෂමාචාරවලින් ආරක්ෂා වීම
- ගුණාත්මක භාණ්ඩ හා සේවා පාරිභෝජනය නිසා පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව තහවුරු වීම
- අවශ්‍ය අවස්ථාවල දී පාරිභෝගික ආරක්ෂණය නිසා නීතිමය රැකවරණ ලබා ගත හැකි වීම
- පාරිභෝගිකයාට ජීවත් වීමට සුදුසු පරිසර තත්ත්වයන් උදා වීම

# ව්‍යාපාරිකයාට

- ගුණාත්මක තත්ත්වයෙන් යුක්ත භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම
- ව්‍යාපාරිකයාගේ පිරිවැටුම වැඩි වීම තුළින් ලාභය ඉහළ යාම
- ප්‍රමිතියකට අනුව නිෂ්පාදනය කිරීම නිසා අපතය අඩු වීම
- අයහපත් තරඟ විරෝධී ක්‍රියා නො මැති වීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇති වීම

**අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් කිහපියක් වර්තමානයේ ක්‍රියාත්මක වේ.**

**ඇමරිකා එක්සත් ජනපදයයේ හිටපු ජනාධිපතිවරයෙකු වූ ජෝන් එෆ්. කෙනඩි විසින් පාරිභෝගික අයිතිවාසිකම් හතරක් ප්‍රකාශයට පත්කර ඇත.**

-  ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය
-  තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය
-  තෝරා ගැනීමට ඇති අයිතිය
-  සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය

**මීට අමතරව පාරිභෝගික ජාත්‍යන්තරය විසින් පහත සඳහන් පාරිභෝගික අයිතිවාසිකම් ප්‍රකාශයට පත්කර ඇත**

- මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය

- වන්දි ලබා ගැනීමට ඇති අයිතිය

- පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය

- සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය

**පාරිභෝගික අයිතිවාසිකම් මෙන්ම පාරිභෝගික වගකීම්ද පාරිභෝගිකයා සතු වේ.**

- විචාරාත්මක දනුවත්භාවය
- සක්‍රීය සහභාගිත්වය
- සමාජය ගැන සැලකිලිමත් වීම
- පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම
- සහයෝගීතාව

දැනුවත්භාවකින් යුත් පාරිභෝගිකයා ගෙවන මුදලට සරිලන වටිනාකමකින් යුත්, ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ තෝරා ගැනීමට පෙළඹේ.

එසේම වෙළෙඳ විෂමාචාර හා පාරිභෝගික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව අදාළ බලධාරීන් දැනුවත් කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි.

තවද, තමා ජීවත්වන පරිසරය ආරක්ෂා කර ගනිමින් , සමාජය පිළිබඳ සැලකිලිමත් වෙමින්, සහයෝගයෙන් කටයුතු කරමින්, තාර්කික පාරිභෝගිකයෙකු ලෙස වෙළෙඳපොළේ හැසිරෙයි.

**ශ්‍රී ලංකාවේ පාරිභොගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන කිහිපයක් පහත දැක්වේ.**

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- මිණුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව
- මධ්‍යම පරිසර අධිකාරිය
- ප්‍රාදේශීය සෞඛ්‍යය වෛද්‍ය නිලධාරී කාර්යාලය
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා පිහිටුවා ඇත.

- පාරිභෝගිකයින්ගේ ජීවිත හා දේපළවලට උපද්‍රවයක් සිදු වන භාණ්ඩ අලෙවිය හා සේවා සැපයීමට එරෙහිව ඔවුන් ආරක්ෂා කිරීම

- අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් වලට නිසි සැලකිල්ල දැක්වීම සහතික වීම

- හැකි සෑම විටම පාරිභෝගකියන්ට තරගකාරී මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා දීමට සහතික වීම

- අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්ඳන් විසින් සිදු කරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට සහනයක් ලබා දීම

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

- ව්‍යවසායන් අතර සීමාකාරී ගිවිසුම් පාලනය කිරීම හෝ ඉවත් කිරීම
- වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළෙඳපොළේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාමේ හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ ආධිපත්‍යතත්වයක් අනිසි ලෙස යොදා ගැනීම නැති කිරීම
- දේශීය හෝ ජාත්‍යනතර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරගකාරිත්වය පිළිබඳ අවහිරතා නැති කිරීම
- තරග විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්ත්ව අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂා කිරීම

- භාණ්ඩ හා සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම
- භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබා ගැනීමට හැකි වීම සහ ඒවායෙහි තත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් හා සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ව්‍යාපාරවලට පහත සඳහන් ආකාරයෙන් වැදගත් වේ.

- අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිතියට අනුව නිෂ්පාදනය, සැපයීම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා විකිණීම සිදු කිරීම නිසා නාස්තිය අවම වී ලාභය වර්ධනය වීම

- පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යොමු වීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගැනීමට හැකි වීම

- වෙළෙඳ විෂමාචාරවලින් වැළකී කටයුතු කිරීමෙන් ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වීම

- ව්‍යාපාරිකයාට මුහුණ දීමට සිදු වන නෛතික තතත්වයන් අවම වීම

- ව්‍යාපාර අතර ඇති වන අනවශ්‍ය තරඟකාරිත්වය අවම වීම

- ඒකාධිකාරී තත්ත්වයන් ඇති නො වීම නිසා සාධාරණ ව තරඟ කළ හැකි වීම

# ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

# ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු

- නිෂ්පාදන ක්‍රියාවලිය හා සැකසීම පිළිබඳව ජාතික හා අන්තර්ජාතික පදනම මත ප්‍රමිති පිළියෙල කිරීම

- කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණ සහ තත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා රසායනාගාර හා පුස්තකාල සේවා පිහිටුවා පවත්වා ගෙන යාම

- දේශීය නිෂ්පාදිත මෙන්ම ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රමිති වලට අනුයුකූලද යන්න පරීක්ෂා කිරීම

- ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන කටයුතු සඳහා පර්යේෂණ පහසුකම් සැපයීම

- ප්‍රමිති සහතික සලකුණු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිති ආයතන හා ඒ සමාන කටයුතුවල යෙදෙන සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම
- අධ්‍යාපනය, උපදේශනය හා වෙනත් මාර්ගවලින් ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන කටයුතු දිරිගැන්වීම

# ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යයන්

- ප්‍රමිති පිළියෙල කිරීම
- ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
  - ස්වේච්ඡාවෙන්
  - SLS සහතික ලාංඡන ක්‍රමය මගින්
  - පූර්ව අපනයන පරීක්ෂාව මගින්
  - ආනයන පරීක්ෂාව මගින්
  - අපනයන පිළිබඳ පිළියෙල කළ මුහුදු ආහාර පරීක්ෂාව මගින්

- ISO ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
- ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම
- ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන ප්‍රවර්ධන කටයුතු
- උපකරණ ක්‍රමාංකන සේවා
- පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම
- පුස්තකාල සේවාව, දේශීය විදේශීය ප්‍රමිති අලෙවිය සහ තොරතුරු සේවා
- තත්ත්ව පද්ධති පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පහත සඳහන් ආකාරයෙන් ව්‍යාපාරවලට වැදගත් වේ.**

- **SLS ලකුණ සහිත නිෂ්පාදිත අලෙවි කිරීම තුළින් තරඟකාරිත්වයට සාර්ථක ව මුහුණ දිය හැකි වීම**

- **SLS ලකුණ නො මැති නිෂ්පාදන ආයතන අභිබවා නියම වශයෙන් වාසිදායක තත්ත්වයක් ලැබිය හැකි වීම**

- **පාරිභෝගික පැමිණිලි අවම කර ගත හැකි වීම**

- **රාජ්‍ය අංශය SLS සලකුණ සහිත භාණ්ඩ මිල දී ගැනීමට ප්‍රමුඛත්වයක් දෙන බැවින් වෙළෙඳපොළ කොටස පුළුල් කර ගත හැකි වීම**

- විදේශ සහතික කිරීමේ සලකුණු (ISO) ලබා ගැනීම තුළින් විදේශී වෙළෙඳපොළේ දී සාර්ථක වීමට ඉඩ ලැබීම

- ප්‍රමිතීන් තුළ පාරිභෝගික අවශ්‍යතා හා නෛතික අවශ්‍යතා ඇතුළත් වන බැවින් නිෂ්පාදිත පිළිබඳ පිළිගත හැකි මට්ටම ඉහළ යාම

- නාස්තිය අවම වී ඵලදායීතාව වර්ධනය වීම

- ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වී සේවක චිත්ත ධෛර්ය වර්ධනය වීම

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

↓

**www.ALNoteBook.com**

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."